# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,010 - 2017 මාර්තු මස 10 වැනි සිකුරාදා - 2017.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 660 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 670 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 674 |


*සැ. යු.* -(i) ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මාර්තු මස 31 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

### කැලණිය ප්‍රාදේශීය සභාව

කැලණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති, බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

*I උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 02 | රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 -12 x 330 - රු. 36,410 (රා.ප.ච.03/2016) (PL1 -2016) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම |
| 02. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 -12 x 330 - රු. 36,410 (රා.ප.ච.03/2016) (PL1- 2016) | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |
| 03. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ආදහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 -12 x 330 - රු. 36,410 (රා.ප.ච.03/2016) (PL1 -2016) | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |
| 04. | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කාර්යාල සේවක සේවයේ කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410 (රා.ප.ච.03/2016) (PL1- 2016) | අ.පො.ස. (සා/පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිත විෂයයන් හය (6) ක් සමත් වී තිබීම (මින් විෂයයන් පහ(5) ක් එකවර සමත් විය යුතු ය.) |

*II බඳවා ගැනීමේ ක්‍රමය:*

(i) ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය/ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ආදාහනාගාර ක්‍රියාකරු සහායක III ශ්‍රේණිය

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

2. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවා කාලය වසරකට ලකුණු 05 | 15 | 50% |
| ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති වෙනත් බාහිර පළපුරුද්ද | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

3. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කාර්යාල සේවක සේවයේ කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*III සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.
(2) තෝරාගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වේ.
(3) පරිවාස කාලය තුළදී පැමිණීම, වැඩ හා හැසිරීම සතුටුදායක වන්නේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.
(4) කණිෂ්ඨ සේවාවලින් බඳවා ගනු ලබන්නන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

*IV පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
(2) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් හෝ පදිංචිය සනාථ කළ යුතුයි)
(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත);
(4) නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ;
(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;
(6) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(7) කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*V අයදුම් කිරීමේ පිළිවෙල :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ අයදුම්පත් 2017.04.10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, "කැලණිය ප්‍රාදේශීය සභාව, කැලණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක.

2. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය.

3. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ:-

(1) උප්පැන්න සහතිකය;
(2) අධ්‍යාපන සහතික;
(3) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබා ගත් එකක් විය යුතුය);
(5) පළපුරුද්ද පිළිබඳ සහතිකය.

ලේකම්,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ - කැලණිය ප්‍රාදේශීය සභාවේ***

*............................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :—————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
2. ස්ථිර ලිපිනය :—————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
5. උපන් දිනය :
   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :————. මාස :————. දින :————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
8. විවාහක/අවිවාහක බව :—————.
9. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද?/ලියාපදිංචි වීමෙන් ද ? :—————.
10. අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :
    අ.පො.ස. (සා.පෙළ) විභාගය :
    සමත් වර්ෂය :—————. විභාග අංකය :—————.

| අ.අ. | විෂයය | සාමාර්ථය | අ.අ. | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

11. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (උ.පෙළ) විභාගය :

සමත් වර්ෂය :———. විභාග අංකය :———.

| අ.අ. | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

(ii) *වෘත්තීය සුදුසුකම්* :————.
(iii) *වෙනත් සුදුසුකම්* :————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්:
   (i) දැනට දරන තනතුර .————.
   (ii) ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග .————.
   (iii) එම තනතුරට පත් වූ දිනය .————.
   (iv) සේවයේ ස්ථිර කිරීමේ ලිපියේ අංකය හා දිනය .————.

13. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? .————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද, රහිතව සේවයෙන් පහ කිරීමට යටත් බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ ........................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතනය :————.

නම :————.

පදවිය :————.

දිනය:————.

03-334

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු වලට බඳවාගැනීම සඳහා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | බරවාහන ක්‍රියාකරු | 01 | PL3-2016 | රු. 25,790-10×270-10×300-10×330-12×350-රු.38,990/- (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, 3/2016 චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ) | ***බාහිර අයදුම්කරුවන් සඳහා,*** <br><br> *(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05 ක් සමත් විය යුතුය. <br><br> ***අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා,*** <br><br> *(ආ)* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. <br><br> මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ. <br><br> ***ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා හා පළපුරුද්ද :*** <br><br> තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම (A පංතියේ රියදුරු බලපත්‍රයක්) හා මෙම තනතුර සඳහා තිබිය යුතු පළපුරුද්ද ලෙස අයි.ටී.ඒ.ටී (I.T.A.T) සහතිකය ලබා තිබීම හා බර වාහන රියදුරෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම. |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 02 | විදුලි කාර්මික | 01 | PL2-2016 | රු. 25,250-10×270-10×300-10×330-12×350-රු.38,450/- (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, 3/2016 චක්‍රලේඛයේ උපලේඛන 11හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ) | *බාහිර අයදුම්කරුවන් සඳහා*<br><br>*(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05 ක් සමත් විය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br><br>*(ආ)* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදල වේ.<br><br>*ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා හා පළපුරුද්ද :*<br><br>තනතුරේ කාර්යභාරයට අදළව තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා පිළිගත් ආයතනයක අදළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ) |

02. ඉහත සඳහන් සියළු තනතුරු වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව පාලනය වේ.

03. *වයස :* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අයකු විය යුතුය. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් ට ද, මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට ද, ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් කොන්දේසි :*

I. සෑම තනතුරකටම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදළ වේ.

II. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක් තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

IV. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුත් අයෙකු විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. *පත්වීමේ ස්වභාවය :*

1. මෙම තනතුර ස්ථිරය, රජයේ සේවකයන් සඳහා 2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට රජය විසින් තීරණය කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය ඔබට අදළ වනු ඇත. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.03.25 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව, නාත්තන්ඩිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය.

07. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

08. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය.
II. ජාතික හැඳුනුම්පත.
III. අධ්‍යාපන සහතික.
IV. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරී සහතිකය).
V. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය).
VI. වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතිකය.
VII. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරු ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත බඳවා ගැනීම් සිදුකෙරේ. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

කේ. පී. චන්දන කුමාර,
ලේකම්,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව,
නාත්තන්ඩිය.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ .............................................. තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................
02. ලිපිනය : ..........................................................................
03. දුරකතන අංකය : ..........................................................................
04. උපන් දිනය : ..........................................................................
වර්ෂය : .................. මාසය : ................. දිනය : ................
05. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
06. ජාතිය : ..........................................................................
07. විවාහක/ අවිවාහක බව : ..........................................................................
08. .......................... වැනි දිනට වයස : ..........................................................................
වර්ෂ : ................... මාස : .................. දින : ..................
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද : ..........................................................................
එසේ නම් පරම්පරාවෙන් ද?/ ලියාපදිංචියෙන් ද? : ..............................................................
10. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................
11. අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................
(පිටපත් අමුණා එවිය යුතුය)
12. වෙනත් සුදුසුකම් : ..........................................................................
13. පළපුරුද්ද : ..........................................................................
14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාල සීමාව :
........................................ සිට .................................. දක්වා
15. පෙර සේවය කර ඇති ස්ථාන : ..........................................................................
16. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :
..........................................................................................................................
. ..........................................................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර, යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළ හැකි බව ද ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුසසෙකු නොවන බව ද මම දනිමි. අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් කරුණු වලට එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

පහත සඳහන් ලිපි ලේඛනවල ඡායා පිටපත් මෙයට අමුණා ඇත.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතික;
03. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
04. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
05. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය);
06. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

....................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ........................................

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතනයේ ප්‍රධානියාගේ සහතිකය.*

ඉහත අයදුම්කරු ...................................... දින සිට මෙම ආයතනයේ ............................. වශයෙන් සේවය කරන බවත්, ඔහු/ ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

.................................................,
අයදුම්කරුගේ අත්සන

දිනය : ...............................

03-402

## මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක III | රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 PL 1-2016 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම (මින් විෂයයන් පහක් එකවර සමත්ව තිබිය යුතු ය.) |
| 02 | පුස්තකාල සහායක III | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 PL 1-2016 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම (මින් විෂයයන් පහක් එකවර සමත්ව තිබිය යුතු ය.) |

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
3. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු ම සේවකයින් බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීම සඳහා පොදු තොරතුරු :-*

1. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න අවුරුදු 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
3. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.
6. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. විධිමත් සම්මුඛ පරීක්ෂනයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කර ගන්නා අයදුම්පත් 2017. 03. 31 දිනට පෙර ලැබෙන සේ "ලේකම් - මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - උඩුගම්පල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
3. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ අදාල තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතු ය.
4. තනතුරු කීපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කල යුතු ය.
5. අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු ය.
   - උප්පැන්න සහතිකය,
   - අධ්‍යාපන සහතික,
   - පදිංචිය තහවුරු කිරීම පිණිස මාස 03 ක් ඇතුළත ලබාගත් පදිංචි වීමේ සහතිකය,
   - මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

6. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඩබ්. එල්. පී. විජේසුන්දර,
ලේකම්,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 23 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

*......................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. *(අ)* මුලකුරු සමග නම :—————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

2. පදිංචි ලිපිනය :—————.

3. දුරකථන අංකය :—————.

4. හැඳුනුම්පත් අංකය :—————.

5. උපන් දිනය : වර්ෂය :—————. මාසය:—————.- දිනය :—————.

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :—————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

8. විවාහක /අවිවාහක බව :—————.

9. ජාතිය :—————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන වග:—————.

11. අධ්‍යාපන සුදුසුකම් :—————.

12. වෙනත් සුදුසුකම්:—————.

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :—————.

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තොරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

03-434

# පළාත් පාලන නිවේදන

## හලාවත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හලාවත ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ජේ. ඒ.එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

2016 නොවැම්බර් මස 10 වැනි දින.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපලක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි."

03-250

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2016.11.09 දින පවත්වන ලද ස්ථාවර කමිටු රැස්වීමේ දී අනුමත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතුවන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9-3 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ආර්. එම්. සී. කේ. රාජසුන්දර,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2016 නොවැම්බර් මස 21 වැනි දින.
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මාර්ග විස්තරය**

| දිග | පළල |
|---|---|
| මීටර් -227 (අඩි - 745) | මීටර් - 2.75 (අඩි - 9) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | ගොඩගම්පල තණහේන පාර |
| වසම | - | පදවිගම්පල |
| ආරම්භය | - | ගම්පල දූලිවල මාර්ගයේ ආර්. පී. රංජිත් උදය කුමාර මහතාගේ නිවස අසලින් |
| අවසානය | - | තණහේන ජේ. සුගතපාල මහතාගේ ඉඩම අසලින් |

ගොඩගම්පල දූලිවල මාර්ගයේ ආර්. පී. රංජිත් උදය කුමාර මහතාගේ නිවස අසලින් ආරම්භව වම්පසින් එස්. පී. සිරිවර්ධන යන අයට අයත් අනුමතිගේවත්ත, ඒ. අමරසිංහ යන අයට අයත් කාලන්ඩියාවත්ත ජී. ජයසුන්දර යන අයට අයත් තෙලඹුගහමුලවත්ත, ඩී. ජී. ජයන්ත සුගතපාල යන අයට අයත් තණහේන පී. ටී. චමින්ද ප්‍රදීප් කරුණාරත්න යන අයට අයත් තණහේනවත්ත යන ඉඩම්වලින් මායිම්වන්නා වූ ද,

දකුණු පසින් ආ. ජී. රංජිත් උදය කුමාර යන අයට අයත් තෙළඹුගහහේන, ආර්. සුමනදස යන අයට අයත් තෙළඹුගහහේන, ආර්. සුනිල් ප්‍රේමතිලක යන අයට අයත් තෙළඹුගහමුලවත්ත, ආර්.සුනිල් ප්‍රේමරත්න යන අයට අයත් තණහේන, ඩී. ජී. ජයන්ත සුගතපාල යන අයට අයත් තණහේන ඩබ්ලිව්. ඩී. මැගිලින් යන අයට අයත් තණහේන යන ඉඩම්වලින් මායිම් වන්නා වූ ගොඩගම්පල තණහේන පාර.

**මාර්ග විස්තරය**

| දිග | පළල |
|---|---|
| මීටර් -57 (අඩි - 186) | මීටර් - 3.65 (අඩි - 12) |


| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | ගල්පොල කොටුමුගුණුව මාර්ගය |
| වසම | - | ගල්පොල |
| ආරම්භය | - | බොලගම රඹුක්කන මාර්ගයේ එච්. ආර්. යූ. සේනානායක මහතාගේ ඉඩම අසලින් |
| අවසානය | - | එන්. ජී. රංජිත් කුමාර මහතාගේ ඉඩම කෙළවර වැට මායිම |

බොලගම රඹුක්කන මාර්ගයේ එච්. ආර්. යූ. සේනානායක මහතාගේ ඉඩම අසලින් ආරම්භව වම් පසින් එච්. ආර්. යූ සේනානායක යන අයට අයත් දෙඩන්ගහමඩිත්තේහේන ඉඩම.

දකුණුපසින් එච්. ආර්. සමන්ති පුෂ්පකාන්ති යන අයට අයත් දෙඩම්ගහමඩිත්තේහේන, එච්. ආර්. ශ්‍යාමා විජේසුන්දර යන අයට අයත් දෙඩම්ගහමඩිත්තේහේන, එන්. ජී. රංජිත් කුමාර යන අයට අයත් දෙඩම්ගහමඩිත්තේහේන යන ඉඩම්වලින් මායිම් වන්නා වූ ගල්පොල කොටුමුගුණුව මාර්ගය

සී.බී.අබේරත්න (ලි.ප.අංකය 1987/120)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තලම්තිකරු
වැලිගමුව,කොටවැල්ල,රඹුක්කන
දු. අංකය 035- 2266290

පිඹුරු අංකය 1066




යොමුව

| | |
|---|---|
| ග | මායිම්ගල |
| පැවැ | පැළ ඉණි වැට |
| කපැවැ | කම්බි පැළ ඉණි වැට |
| අවි | අවිනිශ්චිත |
| සිබැ | සිමෙන්ති බැම්ම |
| ඉ | ඉවුර |
| මාර්ග(ප්‍රාස) | මාර්ගය(ප්‍රාදේශීය සභා) |

පරිමාණය 1 : 1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
කිණිගොඩ කෝරළේ වල්ගම් පත්තුවේ
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ
රඹුක්කන ප්‍රාදේශීය සභාසීමාව තුළ
අංක 5A පදවිගම්පොල ග්‍රාමනිලධාරී වසමේ
ගොඩගම්පල ගමේ පිහිටි
තණහේන පාර
නැමැති ඉඩම දැනට භූමියේ ඇති අන්දමට මැන සාදන ලද
පිඹුර

මුළු බිම් ප්‍රමාණය :-

| කැබලි අංකය | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ. | රූ. | ප. |
| 1 | 0.0760 | 0 | 0 | 30.05 |

මුළු බිම් ප්‍රමාණය : අක්කර 00 , රූ 0 , පර්චස් 30.05

මායිම් ඉහත සඳහන් පරිදි වේ.
මැනීම කළේ : 2016.07.08

CBAberathna
2016. 07. 31
සී.බී. අබේරත්න
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු
වැලිගමුව, කොටවැල්ල, රඹුක්කන
035-2266290

03-320

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අයත් ඉඩම්වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(11) වැනි වගන්ති ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ග නාම ලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 01 | නෙලියන්ගේ පාර | කහඹ පොල්වත්තතැන්න මාර්ගයේ කි.මී. 1 කණුව අසළ | රවීන්ද්‍ර ප්‍රේමලාල් එදිරිසිංහ යන අය පදිංචි ඉඩම | 1. එස්.ඒ.ජී. කරුණාවතී මිය<br>2. ඒ. ජී. ධර්මාවතී මිය.<br>3. ඩබ්. ජී. සෝමාවතී මිය<br>4. ඒ. ජී. රණසිංහ මයා.<br>5. ඒ. ජී. රවීන්ද්‍ර ලක්මාල් එදිරිසිංහ මයා.<br>6. ජී. නිලංකා ලක්මාලි ආරියදාස මිය.<br>7. ඒ. ජී. ගාමිණී ජයලත් මයා. | 1. ඒ. ජී. ජේම්ස් මයා<br>2. යූ. ජී. නන්දවතී මිය.<br>3. සුජිත් ප්‍රසන්න කීර්තිරත්න මයා.<br>4. කේ. ඒ. පී. කළුආරච්චි මයා.<br>5. කේ. ඩී. පී. දයාරත්න මයා.<br>6. වී. ඒ. පී. කේ. වීරසිංහ මයා.<br>7. ඒ. ජී. ලාල් ජයතිලක මයා.<br>8. ඒ. ජී. අසංක ප්‍රදීප් කුමාර මයා. | 984 | 6 |
| 02 | දෙඩම්දෙණිය එකේ කණුවේ සිට මල්ගහපැල හරහා පැරණි ගල් ළිඳ දක්වා පාර | දවුලගල වටදෙණිය ප්‍රධාන පාරට මුහුණලා ඇති මල්පැල වත්ත ඉඩම | පල්ලේ ගෙදරවත්ත අවසානය, කුඹුරු යාය දක්වා | 1. එම්. එස්. මොහොමඩ් අලී මයා.<br>2. කේ. එම්. ජී. රංජිත් ප්‍රියතිලක මයා.<br>3. පී. ජී. ධර්මපාල මයා. | 1. කේ. ජී. ප්‍රසන්න ගුණතිලක මයා.<br>2. ඒ. ජී. පියදාස මයා.<br>3. යූ. ජී. වසන්ත ජයලත් මයා.<br>4. ඒ. ජී. පියදාස මයා<br>5. ඒ. ජී. සෝමපාල මයා.<br>6. යූ. ජී. වසන්ත උඩගෙදර මයා<br>7. ඒ. ජී. සරත් වික්‍රමරත්න මයා. | 410 | 8 |

03-336

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### සොරණාතොට ප්‍රාදේශීය සභාව

2016.12.16 දින පළකරන ලද අංක 1998 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටස - විවිධ දැන්වීම් යටතේ පළ වූ 12-718/11 හි අනු අංක 31. ටිපර් ලොරි රථය - පැය 08 ක් සඳහා ගාස්තුව රු. 850 ක් ලෙස සඳහන් වී ඇත.

එය රු. 8,500 ක් ලෙස සංශෝධනය විය යුතු ය.

එල්. ජී. ආර්. ශාන්තිලතා,
සභා ලේකම්,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 16 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-401

---

### දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

දෙහිවල මහ නගර සභාව විසින් 2016.12.16 වන දින පැවති විශේෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශ ද සලකා බලා බලයලත් නිලධාරි බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් මහ නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව නාගරික කොමසාරිස්වරයා විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ධම්මික මුතුගල,
සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභ සාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන ආනුෂාංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අය කර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2017 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට මහ නගර සභාව යෝජනා කරන්නීය.

**2017 වර්ෂය සඳහා සේවා ගාස්තු පැනවීම**

*ඉඩම් සහ ගොඩනැගිලි සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා ගාස්තු*

| සේවාව | ගාස්තුව |
|---|---|
| ඉඩම් අනුකොටස්වලට බෙදීමේ සැලසුම් අයදුම්පතක් සඳහා | රු. 300 0 |

***අනුබෙදීම් සැලසුම් අනුමත කිරීම සඳහා පෙරසැරි ගාස්තු වර්ග මීටර් වලින් :***

| *බිම් කට්ටි ප්‍රමාණය* | *නේවාසික* | *වාණිජ* |
|---|---|---|
| | *(මාර්ග, කාණු හා පොදු බිම් කොටස් හැර)* | |
| | *රු. ශත* | *රු. ශත* |
| වර්ග මීටර 600 දක්වා (පර්චස් 12 දක්වා) | 330.00 | 1,650.0 |
| වර්ග මීටර 601 සිට 1,000 දක්වා (පර්චස් 12ට වැඩි 20 දක්වා) | 935.00 | 2,200.00 |
| වර්ග මීටර 1,000 සිට 2,500 දක්වා (පර්චස් 20ට වැඩි 50 දක්වා) | 1,100.00 | 3,300.00 |
| වර්ග මීටර 2,500ට වඩා වැඩි වන අවස්ථාවේ දී (පර්චස් 50ට වැඩි) | 1,512.50 | 5,500.00 |

ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව - 500.00

*ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදි කිරීම්වල දී අනුකූලතා සහතික නිකුත් කිරීමේ දී අය කරනු ලබන පෙරසැරි ගාස්තු ඃ*

| *වර්ග මීටර්වලින්* | *නේවාසික රු. ශත* |
|---|---|
| 45 දක්වා | 550.00 |
| 46 සිට 90 දක්වා | 1,650.00 |
| 91 සිට 180 දක්වා | 2,750.00 |
| 181 සිට 270 දක්වා | 3,850.00 |
| 271 සිට 450 දක්වා | 4,950.00 |
| 451 සිට 675 දක්වා | 6,050.00 |
| 676 සිට 900 දක්වා | 7,150.00 |
| 901 සිට 1,225 දක්වා | 8,250.00 |
| 1,225 ට වඩා වැඩිවන එක් එක් වර්ග මීටර 90 ක් සඳහා | 1,100.00 |

*වාණිජ කටයුතු වෙනුවෙන් භාවිතා කරනු ලබන ස්ථාන සඳහා අය කරනු ලබන පෙරසැරි ගාස්තු ඃ*

| *ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටරවලින්)* | *රු. ශත* |
|---|---|
| 45 දක්වා | 1,100.00 |
| 46 සිට 90 දක්වා | 2,200.00 |
| 91 සිට 180 දක්වා | 3,300.00 |
| 181 සිට 270 දක්වා | 4.400.00 |
| 271 සිට 450 දක්වා | 6,600.00 |
| 451 සිට 675 දක්වා | 8,800.00 |
| 676 සිට 900 දක්වා | 11,000.00 |
| 901 සිට 1,225 දක්වා | 13,200.00 |
| 1,225 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර 90 ක් සඳහාම | 1,375.00 |

***අනුකූලතා සහතික නිකුත් කිරීමේ දී*** -

| | *නේවාසික ස්ථානවලින් රු. ශත* | *ව්‍යාපාරික ස්ථානවලින් රු. ශත* |
|---|---|---|
| වර්ග මීටර 300 දක්වා | 3,300.00 | |
| වර්ග මීටර 300ට වඩා වැඩිවන සෑම වර්ග මීටරයකටම | 15.00 | |
| වර්ග මීටර 100 දක්වා | | 3,300.00 |
| වර්ග මීටර 100ට වඩා වැඩිවන සෑම වර්ග මීටරයකටම | | 25.00 |

| | |
|---|---|
| නිරවුල් සහතික නිකුත් කිරීමේ දී | 500.00 |
| වීරීරේඛා සහතික නිකුත් කිරීමේ දී | 250.00 |
| පිටපත් කිරීමේ ගාස්තු | 100.00 |

03-440

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.